සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ
## පළමු වාර පරීක්ෂණය - 2022
## 1st Term Test 2022 - August

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය I | කාලය : පැය 1 යි. |
|---|---|---|

## I කොටස

■ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ගැටළුවක් වන්නේ,
   1. රාජ්‍යයක විවිධ පක්ෂ පැවතීම ය.
   2. රාජ්‍යයක ජනගහනය අධික වීම ය.
   3. නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම ය.
   4. පුරවැසියන්ගේ ආදායම් විෂමතාවන් පැවතීම ය.

02. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,
   1. පරමාධිපත්‍ය බලය
   2. නීත්‍යානුකූල බලය
   3. සර්වජන ඡන්ද බලය
   4. නීතියේ ආධිපත්‍ය බලය

03. ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,
   1. මහා බ්‍රිතාන්‍යය
   2. චීනය
   3. ශ්‍රී ලංකාව
   4. ඉන්දියාව

04. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,
   1. ජනාධිපතිවරයා යි.
   2. අග්‍රාමාත්‍යවරයා යි.
   3. කථානායකවරයා යි.
   4. ආණ්ඩුව යි.

05. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. එංගලන්තය හා ජර්මනිය
   2. ස්පාඤ්ඤය හා ඉතාලිය
   3. ඕලන්දය හා පෘතුගාලය
   4. එංගලන්තය හා ප්‍රංශය

06. රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.
   1. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය
   2. භූමිය, ජනගහනය, ආණ්ඩුව, විරුද්ධ පක්ෂය
   3. ජනගහනය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
   4. ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති, විධායක බලය

07. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,
   1. බලය විමධ්‍යගත කිරීමය
   2. බලය පවරා දීම යි.
   3. බලය බෙදීමයි.
   4. බලය නියාමනය කිරීමයි.

08. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලයකි,

1. එකිනෙකාට ගරු කිරීමට පුරුදු වීම
2. රාජ්‍ය භාෂා කිහිපයක් පුරුදු වීම
3. විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වීම.
4. ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු විම

09. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,

1. ජනතාවගේ ආරක්ෂාව සහතික වන ආකාරයට පාලනය මෙහෙයවීමට මඟ පෙන්වීම ය.
2. ජනතාවගේ ජීවිත, දේපළ හා අයිතිවාසිකම් රැකෙන සේ මානව හැසිරීම් පාලනය කිරීම ය.
3. ජනතාව තුළ නීතිය පිළිබඳ දැනුම තහවුරු කිරීම ය.
4. සමාජයේ වැරදි කරන පුද්ගලයන් සියළු දෙනා අධිකරණය හමුවට පැමිණවීම ය.

10. ශ්‍රී ලංකාවේ පුරුවැසියන්ට ඡන්දය භාවිත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ වයස් සීමාව වන්නේ,

1. වයස අවු. 15 සම්පූර්ණ කර තිබීම ය.
2. වයස අවු. 18 සම්පූර්ණ කර තිබීම ය.
3. වයස අවු. 21 සම්පූර්ණ කර තිබීම ය.
4. වයස අවු. 24 සම්පූර්ණ කර තිබීම ය.

11. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,

1. අගවිනිසුරුතුමා ය.
2. අධිකරණ ඇමතිතුමා ය.
3. නීතිපතිතුමා ය.
4. ඔම්බුඩ්ස්මන්වරයා ය.

12. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කරනු ලබන්නේ,

1. මැතිවරණ කොමිෂන් සභාව විසිනි.
2. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසිනි.
3. රජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.
4. මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කොමිසම විසිනි.

13. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට මුහුණදීමට සිදුව ඇති අහිතකර බලපෑමක් වන්නේ,

1. අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත් වීමයි.
2. බුද්ධිගලනය වේගවත් වීමයි.
3. විවිධ කලාපීය සංවිධාන හා එකතු විමට හැකිවීමයි.
4. විදේශ ආයෝජන හා තාක්ෂණය ගලා ඒමයි.

14. ශ්‍රී ලංකාවේ වාර්ෂික අයවැය පාලනය සිදු කෙරෙනුයේ,

1. මුදල් අමාත්‍යවරයා විසිනි.
2. ව්‍යවස්ථාදායකය විසිනි.
3. ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.
4. ජනාධිපතිවරයා විසිනි.

15. අධිකරණසේවා කොමිෂන් සභාවේ සභාපති ධූරය දරනු ලබන්නේ,

1. නීතිපතිවරයා ය.
2. සොලිස්ටර් ජනරාල්වරයා ය.
3. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් තුමා ය.
4. අග්‍රවිනිශ්චයකාරවරයා ය.

16. පළාත් සභා ක්‍රමය යටතේ මධ්‍යම රජය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදුකරන නියෝජිතයා වන්නේ,

1. පළාත් ආණ්ඩුකරවරයා ය.
2. මහ ඇමතිවරයා ය.
3. පළාත් සභා සභාපතිවරයා ය.
4. පළාත් ප්‍රධාන ලේකම් වරයා ය.

17. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ,
   1. 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   2. 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   3. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
   4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

18. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ මූලධර්මයක් වන්නේ මින් කුමක්ද?
   1. ළමයාගේ නිදහස ආරක්‍ෂා කිරීම.
   2. ළමයාගේ උපරිම යහපත සැලසීම
   3. ළමයාගේ අධ්‍යාපනය සහතික කිරීම
   4. ළමයාගේ සෞඛ්‍යය ආරක්‍ෂාව සහතික කිරීම

19. බ්‍රිතාන්‍යයන් හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතරින් සර්වජන ඡන්ද බල අයිතිය ලාංකිකයන්ට ලබාදුන්නේ,
   1. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි.
   2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගිනි.
   3. 1920 මැනිං ප්‍රතිසංස්කරණ මගිනි.
   4. 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණ මගිනි.

20. මෙරට දේශපාලන ක්ෂේත්‍රයට මුල්වරට විධායක ජනාධිපති ධුරය හඳුන්වා දෙනු ලැබුයේ,
   1. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   2. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   3. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
   4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

21. දකුණු ආසියාතික රටවල ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය සඳහා පිහිටුවාගත් සංවිධානය වන්නේ,
   1. සාර්ක් සංවිධානය
   2. ආසියාන් සංවිධානය
   3. පොදු රාජ්‍ය මණ්ඩලය
   4. කොළඹ ක්‍රමය

22. සංවර්ධිත රටවල ලක්‍ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. නාගරික ජන සංඛ්‍යාව අඩු අතර ළදරු මරණ අනුපාතිකය ද අඩු ය.
   2. ආයු අපේක්‍ෂාව වැඩි අතර ජන සංඛ්‍යා වර්ධන වේගයද වැඩි ය.
   3. භෞතික ජීවන තත්ත්වය දර්ශකය වැඩි අතර විදේශ විනිමය ඉපයීමද අඩු ය.
   4. මානව සංවර්ධන දර්ශකය ඉහළ අගයක් ගන්නා අතර ජන සංඛ්‍යා වර්ධන වේගය ද අඩු ය.

23. ආර්ථික නොවන භාණ්ඩයක් හා ආර්ථික භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
   1. ජලය හා අහාර
   2. ජලය හා වාතය
   3. ඖෂධ හා හිරු එළිය
   4. ඇඳුම් හා ආහාර

24. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනාධිකරණය ලෙස ක්‍රියාත්මක වන්නේ,
   1. මහාධිකරණය යි.
   2. දිසා අධිකරණය යි.
   3. අභියාචනාධිකරණය යි
   4. ශ්‍රේෂ්ඨාධිකරණය යි.

25. පරිසර විනාශයට ප්‍රධානම හේතුව ලෙස සැළකිය හැක්කේ,
   1. දිළිඳුකම ය.
   2. අඩු අධ්‍යාපනය
   3. වැරදි ආකල්ප ය.
   4. නොදැනුමත්කම ය.

26. සමස්ත ජාත්‍යන්තර ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි ගොඩනගාගෙන ඇති සංවිධානයක් වන්නේ කුමක්ද?
   1. පොදුරාජ්‍ය මණ්ඩලය
   2. එක්සත් ජාතීන්ගේ සංවිධානය
   3. සාර්ක් සංවිධානය
   4. නේටෝ සංවිධානය

27. මෑතදී ලොව පුරා කතාබහට ලක් වූ ගැටුමකට සම්බන්ධ වූ රටවල් දෙක වන්නේ,
1. ඉන්දියාව සහ පාකිස්ථානය
2. උතුරු කොරියාව සහ දකුණු කොරියාව
3. රුසියාව හා යුක්රේන ය.
4. ඇමරිකාව සහ වියට්නාමය

28. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යය අතුරෙන් පොදු උපයෝගීතා සේවාවලට අයත් නොවන කාර්යයක් වන්නේ,
1. පොදු ස්ථානවලට විදුලිය සැපයීම
2. මහජන වෙළඳපොළ පවත්වාගෙන යාම
3. මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම
4. පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම.

29. ශ්‍රම සූක්ෂම ශිල්පීය ක්‍රම භාවිතය යනුවෙන් අදහස් කරන්නේ,
1. භාණ්ඩ නිෂ්පාදනයේදී යාන්ත්‍රික ශ්‍රමය බහුලව භාවිත කිරීමයි.
2. භාණ්ඩ බෙදාහැරීමේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.
3. භාණ්ඩ නිෂ්පාදනයේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.
4. වෙළඳ ප්‍රචාරණය සඳහා විවිධ තාක්‍ෂණික ක්‍රම භාවිතා කිරීමයි.

30. සංවර්ධනය වන රටවල් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. මහා බ්‍රිතාන්‍ය, ජපානය, ප්‍රංශය
2. ජපානය, නේපාලය, ප්‍රංශය
3. ඉන්දියාව, ඉතියෝපියාව, මාලදිවයින
4. ඉතාලිය, බෙල්ජියම, පාකිස්ථානය

31. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාගේ නිල කාලය,
1. අවුරුදු 5 කි.
2. අවුරුදු 6 කි.
3. අවුරුදු 4 කි.
4. අවුරුදු 7 කි.

32. පාර්ලිමේන්තුව තුළ සම්මතවන පනත් නීති බවට පත්වන්නේ කාගේ අත්සන යෙදීමෙන් පසුවද?
1. කථානායකවරයාගේ
2. ජනාධිපතිවරයාගේ
3. නීතිපතිවරයාගේ
4. අගවිනිසුරුවරයාගේ

33. ශ්‍රී ලංකාවේ විශාලම දිස්ත්‍රික්කය වන්නේ,
1. කොළඹ
2. ගාල්ල
3. යාපනය
4. අනුරාධපුරය

34. රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකාවේ කීවන විධායක ජනාධිපතිවරයා ද?
1. 6 වන විධායක ජනාධිපතිවරයා ය.
2. 7 වන විධායක ජනාධිපතිවරයා ය.
3. 8 වන විධායක ජනාධිපතිවරයා ය.
4. 9 වන විධායක ජනාධිපතිවරයා ය.

35. මෙරට ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව,
1. 225 කි.
2. 196 කි.
3. 161 කි.
4. 245 කි.

36. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව,
1. 22 කි.
2. 25 කි.
3. 24 කි.
4. 20 කි.

37. ජාතික ලැයිස්තුව තුළින් පත්වන මන්ත්‍රී සංඛ්‍යාව වන්නේ,

1. 29 කි. 2. 16 කි. 3. 196 කි. 4. 15 කි.

38. රාජ්‍යවල ප්‍රධාන ස්වරූප දෙක කුමක්ද?

1. ජනාධිපති හා පාර්ලිමේන්තු රාජ්‍යය.
2. ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය.
3. ඒකීය හා සන්ධීය රාජ්‍යය.
4. ජාතික හා ප්‍රාදේශීය රාජ්‍යය.

39. ගැටුම් අවම කර ගැනීම සඳහා පුරවැසියෙකු තුළ වර්ධනය කරගත යුතු සමාජ ගුණාංග වන්නේ,

1. ජීවිත හානි වැළැක්වීම යි.
2. මානසික ආතතිය වැළැක්වීම යි.
3. අන් මත ගරු කිරිම යි.
4. නිර්මාණාත්මක චින්තන වර්ධනය යි.

40. වර්තමාන ලෝකයේ බොහෝ රටවල තනි ආර්ථිකයක් ලෙස ඒකාබද්ධව කටයුතු කිරීමේ ප්‍රයත්නයක නිරතවෙමින් සිටින බව පෙනෙන්නට ඇත. ඊට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ,

1. සන්නිවේදනයේ දියුණුවයි.
2. ප්‍රවාහනයේ දියුණුවයි.
3. ගෝලීයකරණයේ බලපෑමයි.
4. විදේශ වෙළඳාමේ දියුණුවයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය II | කාලය : පැය 3 යි. |
|---|---|---|

### II කොටස

- පළමවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
    ii. බහු සංස්කෘතික සමාජයක් බිහිවීම කෙරෙහි බලපාන සධක දෙකක් නම් කරන්න.
    iii. ඒකීය රාජ්‍ය දෙකක් සඳහා උදාහරණ සපයන්න.
    iv. ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද බලය පාවිච්චි කිරීමට ලැබෙන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
    v. ''හිඟකම'' තුළින් පැන නගින මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.
    vi. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) සතු බලතල හා කාර්යය දෙකක් සඳහන් කරන්න.
    vii. ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂිත නීති වර්ග දෙකක් සඳහන් කරන්න.
    viii. දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් සඳහන් කරන්න.
    ix. සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම සිදු නොවීම හේතුවෙන් සිදුවිය හැකි අවාසි දෙකක් සඳහන් කරන්න.
    x. රාජ්‍යයකට පැවරෙන ප්‍රධාන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

02. i. ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න.
    ii. නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආසියාවේ රටවල් දෙකක් නම් කරන්න.
    iii. a. රටක විපක්ෂයේ කාර්යයන් දෙකක් සඳහන් කරන්න.
    b. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

03. i. නීතියේ මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.
    ii. දේශීය නීතියට අයත් ප්‍රභේද තුන සඳහන් කරන්න.
    iii. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරෙන කාර්යයන් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

04. i. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙකක් සඳහන් කරන්න.
    ii. ඩොනමෝර් කොමිසමේ නිර්දේශ තුනක් සඳහන් කරන්න.
    iii. 1978 ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා සතු බලතල තුනක් සඳහන් කරන්න. ඉන් එකක් විස්තර කරන්න.

05. i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් සඳහන් කරන්න.

ii. රටක පළාත් පාලන ආයතන පිහිටුවීමේ අරමුණු මොනවාද?

iii. මහ නගර සභාවක කාර්යයන් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

06. i. සංවර්ධිත රටවල් සඳහා උදාහරණ දෙකක් දෙන්න.

ii. සංවර්ධනය මැනිම සඳහා යොදා ගන්නා මිනුම් දඬු තුනක් දක්වන්න.

iii. සංවර්ධනය කරායන ගමනේදී ලංකාව මුහුණ දෙන ගැටළු තුනක් සඳහන් කරන්න. ඉන් එකක් පැහැදිලි කරන්න.

07. i. පරිසර පද්ධතිය සකස් වී ඇති අජෛවී සංරචක දෙකක් නම් කරන්න.

ii. පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවාවන් තුනක් සඳහන් කරන්න.

iii. තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යාම සඳහා රජය මගින් ඉටු කළ යුතු යුතුකම් තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න.